# අද්‍යතන සිංහල සිව්පද කවිය

කල්ප එරන්ද
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

## ABSTRACT

කිසියම් විරිතක නවතාවක් පවත්නේ නම් එම විරිත පහළ වූ අවධියට පමණක් සීමා වීමක් හෝ එයින් මතු එම විරිතෙහි ඇති නිර්මාණ ශක්තිය පිරිහීමට පත්වීමක් හෝ සිදු නො වේ. අනුරාධපුර යුගයේ සිට වර්තමානය දක්වා සුභාවිත සිව්පදය මෙහිලා දෙස් දෙයි. විරිතකින් වියුක්ත ව ගෙන එහි නිර්මාණ ශක්තියක් ඇති නැති බව තීරණය කළ නො හැකි ය. යම් විරිතක ස්වරූපය වියුක්ත ව විමසිල්ලට නතු කිරීම යාන්ත්‍රික විධික්‍රමයකි. විරිත් පමණක් විමසීමෙන් ඒවා වර්තමානයට නො ගැළපේ යැ යි විනිශ්චයකට එළඹිය නො හේ. සම්මත විරිතක් වුව ද උචිත අන්තර්ගතයක ග්‍රහණයට නතුකර ගැනීමෙන් වර්තමානයට ගැලපෙන සාර්ථක පද්‍ය කාව්‍යයක් බිහි කළ හැකි ය. සිංහල පද්‍යාවලිය සම්මර්ශනය කරන කල සිව්පදය මෙහි ලා ඉදිරියෙන් සිටින බැව් පවසනු නිසි ය.

ගද්‍යය ඇරඹීමට ද පෙර නිපන් පද්‍යය ජනයා අතර සම්භාවිත වූයේ සිව්පද කාව්‍ය ලෙසිනි. විද්‍යමාන සාධක අනුව සීගිරි ගී අතරින් හමුවන සිව්පදය අප සතු සිව්පදයේ හැඩරුව ප්‍රත්‍යක්ෂ කොට දෙයි. කෘතීන් ලෙස ගත් කල සඳකිඳුරු දා කවේ සිට කොළඹ යුගයේ තරුණ කවි පරපුර තෙක් අඩු වැඩි වශයෙන් සිව්පදයේ ජනප්‍රියත්වය රැඳී පැවතිණ. සිංහල සන්දේශාවලිය ම සිව්පද කවියෙන් රචනා වීම සම්ප්‍රදායට අනුයුක්ත වීමක් සේ දක්නට හැකි ය. එමතු ද නො ව නන් විරිත් වහල් කොට ගනිමින් අවස්ථාවෝචිත ව අත්දැකීම් ප්‍රතිනිර්මාණයෙහි ලා තත් සිව්පද විරිත් ඖචිත්‍යයෙන් යොදා ගැනීම විදග්ධ සන්දේශ සප්තකයෙන් වටහා ගත හැකි ය. ගම්පොල කෝට්ටේ යුගයේ ජනප්‍රිය සිව්පදය මහනුවර යුගය වන විට නන් විරිත් පැමිණිය ද එහි වටිනාකම් අඩු නො විණ. උපදේශ කාව්‍ය, ශෘංගාර පද්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති ඈ නෙක විෂය ක්ෂේත්‍රයන් යටතේ තත් යුගයේ සිව්පද ජනප්‍රිය විය. එය අනුදත් කොළඹ කවීන් ද සිය අත්දැකීම් ප්‍රතිපාදනයෙහි ලා වහල් කොට ගත්තේ සිව්පද ම ය. එකී පද්‍ය කලාත්මක අගයෙන් හීන වුව ද එවනාහි ආකෘතියෙහි වරදක් නො ව ඔවුන් සතු ව පවත්නා දෘෂ්ටිමය ඌනතාවක් සේ හඟිමු. එසේ වුව ද විමලරත්න කුමාරගමගේ එකී ඌනතා අතික්‍රමණය කළ සාර්ථක සිව්පද රචනා දක්නා හැකි ය.

අභිනවයෙන් නිපන් නිසඳැස් පද්‍ය සම්ප්‍රදාය කරණකොට ගෙන සිව්පදයේ පරිහානි යුගය එළැඹිණ. ගතිකත්වයට බඳුන් වන සමාජයට සාපේක්ෂ ව සන්දර්භය හා වස්තු විෂය වෙනස් වුව ද සම්ප්‍රදාය නො නැසී අඩු වැඩි වශයෙන් එහි ම රැඳී සිටීමට අද්‍යතන කවියා යත්න දර යි. කලින් කලට විවිධ රැලි පැමිණිය ද ඒ හා සමඟ ම එය ගසාගෙන යනු විනා ස්ථිර ව නො පවතී. කොළඹ කවියට එරෙහි ව නිසඳැස බිහි වුව ද එය අතිශය බුද්ධි ගෝචර රටාවට නම්‍ය වී ජනයාගෙන් කවිය ඈත් කිරීමට හේතු විය. එහි ඵල තව ම සමාජය අත්විඳි යි. එකී භාවමය ලොවින් මිදී සමාජ සත්‍ය යථාර්ථය රූපණය උදෙසා නව මං පෙත් සොයා යෑමේ දී අද්‍යතන කවියා නිදහස් කාව්‍ය රීතියට නම්‍ය වූයේ සම්ප්‍රදායෙන් පෝෂණය ලබමින් එය අගයමින් හා එය සමතික්ක්‍රමණය කරමිනි. මෙහි දී සම්ප්‍රදායට ආශක්ත ව සිව්පදය යළි හිස ඔසවන අයුරු දක්නට හැකි විය. කොළඹ කිවියේ දෘෂ්ටිමය ඌණතා හේතු කොට ගෙන සිව්පදය පිරිහීම නිසා නිසඳැස් කවිය බිහි වුව ද නිසඳැස යටපත් කරමින් අද්‍යතන කවියෙහි සිව්පදය පුනරාගමනය වී ඇති අයුරු දක්නට ලැබේ.

අද්‍යතන කවීන්ගේ සිව්පද සම්මර්ශනය කරන කල ඔවුනගේ වස්තු විෂයයන් නෙක විෂය ක්ෂේත්‍රයන්හි පැතිරී පවත්නා බැව් දක්නා හැකි ය. මේ හමුවේ තත් කවීන් වස්තු විෂයෙහි ඒකාකාරී බවක් දැක්වී ය යන මෙතෙක් පැවති විචාරක අදහස තර්ක ගෝචර නො වන බව පැවසිය යුතු ය. ඔවුන්ගේ සිව්පද වීමංසනය කිරීමේ දී විසිරුණු වස්තූන් හඳුනාගත හැකි අතර ඒ සියල්ල පාහේ සමකාලීන සමාජ සංස්කෘතික ලක්ෂණ පිළිබිඹු කරන්නක් ලෙස ද දක්වනු නිසි ය. ඔවුහු ඒකීය වස්තු විෂයක සිරිගත නො වී කම්කරු පාන්තික ජීවන යථාර්ථය, පන්ති විෂමතාව හා සමාජ අසාධාරණය, ආනයන අපනයන ආර්ථිකය, තරුණ අසහනය, යුද්ධය, අධ්‍යාපන ක්‍රමය, සමාජ ආලෝලන, ප්‍රේමය, හුදකලාව හා බැඳුණු මානව ධර්මතා ඈ නෙක ක්ෂේත්‍රයන් කෙරෙහි සිය කාව්‍යාක්ෂිය යොමු කරති.

අද්‍යතන සිව්පද කවීන්ගේ කාව්‍යයන්හි කලාත්මක අගය විමසීමේ දී භාෂාව වෙසෙස් වේ. අත්දැකීම සූචනය කිරීම සඳහා , උචිත පරිදි භාෂාව හැසිරවීමෙහි ලා තත් කවීහු බොහෝ සෙයින් සමත් වෙති. මෙහි දී විදග්ධ භාෂාව, ජන කාව්‍ය භාෂාව සේ ම ජීව ව්‍යවහාර භාෂාව සුඛනම්‍ය ලෙස පරිහරණය

කොට ඇති අයුරු දක්නට ලැබේ. භාෂාව ධ්වනි පූර්ණ ලෙස භාවිත කිරීමෙහි ලා නූතන සිව්පද කවියා විමසිලිමත් ව ඇති බැව් දෘශ්‍යමාන ය. ඔවුනගේ සංකල්පරූප වීමංසනය කරන කල පසක් වනුයේ ඒ කාව්‍යයේ තට්ටු පිට ගොඩගසනු වෙනුවට අවස්ථාවෝචිත ව සිය අත්දැකීම් ප්‍රතිපාදනයෙහි ලා වහල් කොටගත් අලංකාර විධික්‍රමයක් බව ය. පැරණි කවීන්ගේ අලංකාර රීතීන් වෙත ම ආශක්ත නො වී ස්වීයත්වය ප්‍රකට කරනසුලු නව්‍යත්වයෙන් හා ඖචිත්‍යයෙන් යුතු සංකල්පරූප භාවිතයට ගැන්මට තත් කවීහු සමත් වෙති. කොළඹ කවියා සේ අනෞචිත්‍ය සංකල්පරූප පරිහරණය අද්‍යතන සිව්පද කවීන් කෙරෙන් විද්‍යමාන නො වේ.

මෙනයින් බලන කල පසක් වන කරුණක් වනුයේ අද්‍යතන සිව්පද කවීහු සම්ප්‍රදායට ගෞරව කරන, සම්ප්‍රදාය අගයන, සම්ප්‍රදායෙන් පෝෂණය ලබන හා සම්ප්‍රදාය සමතික්‍රමණය කළ කවි පරපුරක් සේ ය. මෙලෙස හඳුනා ගන්නා අද්‍යතන සිංහල සිව්පද කවිය අනාගතයේ කිනම් නව ආකෘති සිංහල කවියට එක් වුව ද කිනම් මැසිවිලි පැවතිය ද අචල කාව්‍ය සම්ප්‍රදායක් සේ අක්මුල් නො සිඳී සිංහල භාෂාව පවත්නා තුරා ඉන්ද්‍රඛීලයක් සේ පවත්නා බව ය. මෙවනාහි සිංහල කවියාගේ ලේ නහර සිඹ සනහා ඇදෙන ජීව රුධිරය සේ කිනම් කවියෙකු වුව කෙතෙක් පිටුපෑව ද අහක බැලිය නො හැකි සම්ප්‍රදායක් සේ මුල් බැස ඇති බැව් පවසනු යුක්ති යුක්ත ය.